# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1944/51 - 2015 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා - 2015.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 08 වැනි දින.

#### උපලේඛනය

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, ගන්නෑව කෝරළයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කවටයාමාන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ, කවටයාමාන ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. සුබ්‍රමනියම් විසින් පිළියෙල කරන ලද අංක 1528 දරන 2015.07.27 දිනැති අනුරේඛනයෙහි පෙන්නුම් කර ඇති පහත සඳහන් පරිදි මායිම් සහිත, කැබලි අංක 01 ලෙස සඳහන් ප්‍රමාණය අක්කර 4, රූඩ් 0, පර්චස් 0.0 ක් වූ මුළු ඉඩම.

01. කැබලි අංක 01 ලෙස සඳහන් ප්‍රමාණයෙන් අක්කර 4, රූඩ් 0, පර්චස් 0.0 ක් වූ ඉඩම

| | | |
|---|---|---|
| උතුරට | : | පාර සහ එම භූමියේම කොටස (රහතුන්ගොඩ වත්ත, ක්ෂේත්‍ර අංක 6) ; |
| නැගෙනහිරට | : | එම භූමියේම කොටස (රහතුන්ගොඩ වත්ත, ක්ෂේත්‍ර අංක 6) ; |
| දකුණට | : | එම භූමියේම කොටස (රහතුන්ගොඩ වත්ත, ක්ෂේත්‍ර අංක 6) සහ පාර (අඩි 8 පළල) ; |
| බටහිරට | : | පාර (අඩි 8 පළල). |
| හිමිකම් කියන අය | : | ජනතා වතු සංවර්ධන මණ්ඩලය. |

12 - 937